


# ස්වර්ණමාලී

## මහා ථූපාභිවන්දනා

2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය හා සබැඳිව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම සැට වස් පූර්ණය සැමරුම

**2011 ජුනි 04 වන දින සන්ධ්‍යාවේ සිට පසුදා පහන් වන තුරු ස්වර්ණමාලි මහා සෑ සලපතළ මළුවේදී පැවැත්වෙන සාරාණීය මහා පුණ්‍යෝත්සවය**

**ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව,**
**ගල්දූව ආරණ්‍ය සේනාසනය, අම්බලන්ගොඩ.**



## පුණ්‍ය ප්‍රාර්ථනාව

අපටම පිහිටවීමට ලොව පහළවී වදාළාවූ අප සරණ ගිය ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ
ඒ අසිරිමත් ශ්‍රී සම්බුද්ධත්ව මංගල්‍යයේ 2600 වන ජයන්තිය හා සබැඳිව...
ලංකා ධරණී තලයේ වියැකෙමින් තිබූ ප්‍රතිපත්ති සාසනයට නව ජීවයක් දෙමින් බිහි වූ,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට වර්ෂ 60ක් සපිරෙන මොහොතේ...
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක බෝධිසත්ව ගුණෝපේත, අතිගරු, පූජ්‍යනීය රාජකීය පණ්ඩිත
**කඩවැද්දුවේ ජිනවංශ** මාහිමියන් වහන්සේ, අතිගරු පූජ්‍යනීය රාජකීය පණ්ඩිත **මාතර ශ්‍රී ඥාණාරාමාභිධාන**
මහෝපාධ්‍යායන් වහන්සේ ප්‍රධාන අපවත් වී වදාළ සංඝ පීතෘන්වහන්සේලාට පුණ්‍යානුමෝදනා කිරීමේ ශීර්ෂයෙන්...
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන සභාපති අතිගරු **මිනුවන්ගමුවේ නාගිත** මාහිමි,
වත්මන් යෝගාශ්‍රමාධිපති අග්ග මහා කම්මට්ඨානාචාර්ය අතිගරු පූජ්‍යනීය **නාඋයනේ අරියධම්ම** මාහිමි ප්‍රධාන
මහා සංඝ රත්නයට ධර්මාරක්ෂාව ලැබේවායි පතමින්....
ගෞතම සම්බුදු සසුන සුරැකී තවත් බොහෝ කලක් ලෝසත්නට සෙත සැලසේවා යන පුණ්‍ය ප්‍රාර්ථනා පෙරදැරිව
දහසකට අධික පූජ්‍යනීය මහා සංඝ රත්නය පෙරටු කරගෙන ලක්ෂ සංඛ්‍යාත සැදැහැවතුන්ගේ සහභාගීත්වයෙන්
සිදුකෙරෙන අසිරිමත් ආමිස ප්‍රතිපත්තිමය මහා පුණ්‍යෝත්සවයයි.

# ස්වර්ණමාලී මහා ථූපාභිවන්දනා

2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය හා සබැඳිව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම සැට වස් පූර්ණය සැමරුම

# ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව

විසි අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර මහා බෝසතාණන් වහන්සේ තම මෑණියන් වහන්සේ කරපිට තබාගෙන මහා සයුර තරණය කොට ජීවිතය ආරක්ෂා කර දී ජීවිතාන්තය දක්වාම තම මෑණියන්ට ආදර ගෞරවයෙන් ඇප උපස්ථාන කළහ. අවසන් මොහොතේදී ඉතා අගනා අවවාදයක් එතුමිය ප්‍රකාශ කළාය. පුතනුවනි! ඔබ ජලයෙහිදී ද, ගොඩබිමේදී ද, මට බොහෝ සේ උපකාර කරන ලදි. ඒ උතුම් පුණ්‍ය මහිම බලයෙන් මතු ලොව්තුරා බුදුබව ලබන්වා යැයි එතුමිය ආශිර්වාද කළාය. එතැන් පටන් ප්‍රඥවෙන් අග තැන්පත් වෙමින් පාරමිතා, උප පාරමිතා, පරමත්ථ පාරමිතා වශයෙන් තුන් අයුරකින් පාරමිතාවෝ පුරණ ලදහ. මේ කාලය තුල බුදුරජාණන් වහන්සේලා පන්ලක්ෂ දොලොස් දහස් විසිහත් නමක් බෝසතාණන් වහන්සේට මුණ ගැසුනහ. ඒ ඒ බුද්ධ ශාසනවලදී අප්‍රමාණ කුසල ධර්ම සිදු කරමින් ලොව්තුරා බුදු බව පැතූහ.

නොයෙක් ආකාරයෙන් ජීවිත පරිත්‍යාගයෙන් පුරණ පද පාරමි බලයෙන් ජයසිරි මහා බෝ මැඩදී සවාසනා සකල ක්ලේශයන් සෝදා හැර ලොව්තුරා බුදු බවට පත් වී වදාළ සේක. එතැන් පටන් අවුරුදු 45 ක් දෙව් මිනිසුන් සහිත ලෝකයාට ධර්ම සැනසුම දෙමින් අසංඛ්‍ය ගණන් පිරිසට මහඟුඵල නිවන් සුව අත්කර දුන්හ. මතු අනාගතයෙහි ශාසනය අවුරුදු 5000ක් කල් පැවැත්මට අවශ්‍ය සියලු කටයුතු සලසා තබා උපතින් අවුරුදු අසූ වියේදී පිරිනිවන් පා වදාළ සේක.


තථාගත බුදුරජාණන් වහන්සේගේ නිර්මල ශාසනය රැක ගැනිම සඳහා යෝධ පරාක්‍රම වීර්යය ඇති මහා ප්‍රාඥයින් පිරිසක් ලැබිණ. එයින් සාරිපුත්ත මහ රහතන්වහන්සේ මහ මුගලන් මහ රහතන්වහන්සේ ආදී උතුමෝ ඉර හඳ මෙන් බැබලී බැබලී ලෝක ශාසනික සේවය සිදු කලහ. තථාගත පරිනිර්වාණයට පෙර ඒ උතුමෝ ද පිරිනිවුනහ.

ඉන් අනතුරුව මේ ශාසනය භාරගෙන කටයුතු කරන ලද්දේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේය. උන් වහන්සේ සංඝ පිතෘවරයෙකි. ප්‍රථම සංගායනාව පවත්වා ශාසන සංශෝධනයක්ද කරණ ලදි. රාජ රාජ මහාමාත්‍යාදීන්ගෙන් ලද උපකාර අනුග්‍රහ නිසා ශාසනය ඉතාම හොඳින් ආරක්ෂා කර ගැනිමට පුණ්‍යවන්ත උතුමන්ට භාග්‍ය සැලසුණි. මේ අතර ශාසනයට විශාල පරිහානිකර අවස්ථාද එළඹුණි. අධර්මිෂ්ඨ රජවරුන් නිසා ශාසනයට, භික්ෂු සංඝයාට කරදර පීඩා උදාපත් විය. බොහෝ සඟ පිරිස සිවුරු හැර ගියහ. අතිශයින්ම ශාසනයට හිතවත් වු භික්ෂුන් වහන්සේලා වනගත වී පැවිදි උපසම්පදාව බොහෝ දුෂ්කරතා මැද ආරක්ෂා කරගත්හ.

මහා මිහිඳු මහරහතන් වහන්සේ නිසා ලංකාවට උතුම් ශාසන දායාදය ලැබුණි. ලක් දෙරණට ඒ උතුම් ශාසන දායාදය ලැබී වර්ෂ දෙදහස් තුන්සියය ඉක්ම වී ඇත. අපේ රටේ පහළ වු බෞද්ධ රජදරුවෝ බුද්ධ ශාසනය පුදුමාකාර විදිහට රැකබලා ගත්හ. මහා සංඝ රත්නය රැකගත්හ. වෙහෙර විහාර ඉදිකළහ. ශාසන උන්නතිය සඳහා පුරුෂ වීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන්, ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළහ.

නමුත් විවිධ බලපෑම් නිසා ලංකා බුද්ධ ශාසනයද කීප වතාවක්ම අතුරුදහන් විය. මහා ස්වාමින්ද්‍රයන් වහන්සේලා විදේශ රටවලින් පැවිදි උපසම්පදාව රැගෙනවිත් නැවත බුදු සසුන පිහිටවුහ.

ලංකා භූමියෙහි බුද්ධ ශාසනය අතුරු දහන්වීමෙන් පසුව සියම් මහා නිකායේ ප්‍රථම සංඝරාජ මාහිමියන් විසින් නැවත ප්‍රතිෂ්ඨාපනය කෙරිණි. එයද කලක් යෑමෙන් සිදු වු නා නා විධ වෙනස්කම් නිසා අමරපුර මහා නිකාය නමින් තවත් නිකායක් තත් මහා නායක මාහිමියන් වහන්සේයගේ මුලිකත්වයෙන් ඇති විය.



අතිගරු පූජණීය රාජකීය පණ්ඩිත
**මාතර සිරි ඤාණාරාමාභිධාන**
මහෝපාධ්‍යාය මා හිමියන්

# ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව...



අතිගරු පූජණීය රාජකීය පණ්ඩිත
**කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන**
මහෝපාධ්‍යාය මා හිමියන්

ලංකාවට ආරණ්‍යක ප්‍රතිපත්තියක් අවශ්‍ය යැයි වටහාගත් අතිපූජ්‍ය අඹගහවත්තේ මා හිමියන් වහන්සේ වර්ෂ 1862 දී එකී මා හිමියන් වහන්සේ ප්‍රමුඛ ස්වාමීන් වහන්සේලා කීප නමක් රාජ්‍ය අනුග්‍රහයෙන් බුරුම (මියන්මාර්) රටට වැඩම කොට එහිදිද රාජ්‍ය අනුග්‍රහයෙන් රාමඤ්ඤ දේශයේදි පැවිදි උපසම්පදාව ලබා එම රටේදි අධ්‍යාපනය වශයෙන් ගත යුතු සියල්ල තම ජීවිතයට සම්බන්ධ කොට රාජ්‍ය අනුග්‍රහයෙන් එකී සඟ පිරිස ලංකා බුද්ධශාසනයට නවත් ශක්තියක්, බලයක් දීමේ අටියෙන් ශ්‍රී ලංකාවට වැඩම කොට 1864 දී ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය පිහිට වූහ. අතිපූජ්‍ය අඹගහවත්තේ ඉන්ද්‍රසභවර ඤාණසාමි නැමැති මා හිමියන් වහන්සේ ප්‍රථම මහා නායක පදවියට පත්වූහ. එතැන් පටන් මෙම මහා නිකායේ මහා නායක මා හිමියන් වහන්සේලා 11 නමක් මේ වන විට පාලනය කර ඇත.

2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් ක්‍රි ව 1940 ගණන් වල්දී ගිහි පැවිදි බොහෝ පිරිස් නොයෙක් නොයෙක් අදහස් ඉදිරිපත් කරන ලිදි. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ පාලක සංඝ සභාවේදී ද මෙම කර්තව්‍යය පිළිබඳව සාකච්ඡාවට භාජනය කරන ලිදී. තත් නිකායික මහානායක මාහිමියන් වහන්සේ ප්‍රමුඛ මහා සඟපිරිසද නොයෙක් අදහස් ඉදිරිපත් කරණ ලිදී.

එම සංඝ සභාවට වැඩම කොට පසෙක සිටි අප ගුරුදේව අතිපූජ්‍ය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංස මහෝපාධ්‍ය මාහිමියන් වහන්සේ එක හෙලාම මෙසේ කියා ඇත. චෛත්‍ය, විහාර, ධර්මශාලා ආදිය ගොඩනැගීම තුලින් බුදු සසුන රැක ගැනීමට නොහැකිය. බුද්ධශාසනය චිරස්තිථිය සදහා අරණ්‍ය සේනාසන ඇති කර සීලවන්ත භික්ෂු පිරිසක් ඇති කළයුතු යැයි කීහ. එම අදහසට බොහෝ දෙනෙක් කැමති වූහ. සමහර දෙනෙක් අකමැති ද වූහ.

නමුත්, අභීත සිංහ රාජයකු වැනි, පිනැති, තේජෝ බල පරාක්‍රමයෙන් යුක්තවූ, අතීතයේ පුරණ ලද පාරමී ශක්තිය ඇති, දකින්න වුන් සඳහා ප්‍රිය ගතියකින් යුක්ත, සීල, ගුණාදියෙන් යුක්ත, විචාරාත්මක දේශනා කෞශල්‍යක් ඇති විශාල පරිවාර සම්පත්තියක් ලැබීමට මහා වාසනාවක් ඇති අප මහෝපාධ්‍ය මා හිමියන් වහන්සේ එදා මහා සංඝ සභාවේදි ගත් එම තීරණය මොන තරම් කරදර පීඩා හිරිහැර සතුරු පීඩා පැමිණියත්, ඉදිරියට තැබූ පාදය මොන ලෙසකින්වත් ආපස්සට ගත්තේ නැත.

මෙම යෝධ සත්කාර්ය ආරම්භ කිරීම සදහා මහා සාගරය වැනි මහා නුවණක් ඇති අතිපූජ්‍ය මාතර සිරි ඤාණාරාම මාහිමියන් වහන්සේ පෙරමුණේ තබා ගත්හ. උන් වහන්සේ ද අප මා හිමියන් වහන්සේ ද ප්‍රමුඛව ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායට අන්තෝගතව, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව නැමැති පිං කෙත 1951 ජූනි මස 18 වැනි පොසොන් පුර පසළොස්වක පොහොය දිනයේදි අති උත්කර්ෂවත් අන්දමින් ආරම්භ කළහ.

එදා ප්‍රථමයෙන් 12 නමක් පැවිදි බිමට පත්වූහ. එයින් ආරම්භවූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පුර පසළොස්වකදා දිලෙන පුන් සඳ මෙන් ආලෝකමත් විය. විශාල සඟ පිරිසක් සහ දායක පිරිසක් සිල්වත්, ගුණවත් බවට පත් කළහ. 1951 ආරම්භ කළ යෝගාශ්‍රම සංස්ථාව මේ වන විට ලංකාව පුරාම ආරණ්‍ය සේනාසන, යෝගාශ්‍රම, විවේක සේනාසන ආදී වශයෙන් ශාඛා ස්ථාන 120 ක් පමණ ඇත. එම සේනාසන සියල්ලෙහිම වැඩ වසනු ලබනුයේ අතිපූජ්‍ය මා හිමියන් වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙති. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ සභාපති ධූරන්ධර අතිපූජ්‍ය මිනුවන්ගමුවේ නාගිත මාහිමිපාණන් වහන්සේද, අතිපූජ්‍ය පහලවිටියල ජනානන්ද මාහිමියන් වහන්සේද මහඟු සේවයක් ශාසනයට කරමින් පසුවෙති. එසේම අහසේ දිස්වණ සූර්ය මණ්ඩලය, චන්ද්‍ර මණ්ඩලයමෙන් බුදු සසුනටත්, රටටත්, ජාතියටත්, මහඟු සේවයක් සලසමින් මහා ආලෝකයක් මෙන් බැබලෙමින් වැඩ සිටින, වත්මන් ප්‍රධාන අනුශාසක අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමියන් වහන්සේ තත් යෝගශ්‍රම සංස්ථා නිර්මාතෲවර මා හිමියන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයකි.

තවද අනේක පුණ්‍ය ශක්ති ඇති මහාථෙර, ථෙර, මධ්‍යම, නවක, භික්ෂූන් වහන්සේලා මෙම මහා පුණ්‍ය ක්ෂේත්‍රය තුල වැජඹෙති.

# ප්‍රධාන අනුශාසක මාහිමියන්ගේ සුභාශිංසනය

**නමෝ තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස...**

සුඛෝ බුද්ධානං උප්පාදෙ, බුදු උපත ලොවට සැපතකි. බුදු උපතින් මහපොළවත් සැනසීගියේ නිතැතිනි. නරකාදියේ ගිනි නිවුනේ ඒ අසිරියෙනි. සදෙව්ලෝ බඹලෝ පිරී ඉතිරී ගියේ අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය ජනතාව මග ඵල ලැබීමෙනි. අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය පිරිසක් අර්හත්වයෙන් සැනසුනේ බුදු උපතිනි.

සිද්ධාර්ථ ගෞතම ශාක්‍යමුනීන්ද්‍ර සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියේදී සපරිවාර මාර පරාජය කොට සම්බුද්ධ රාජ්‍යයට පත්වී වසර 2600 ක් සපිරෙනුයේ ක්‍රි. ව. 2011 වෙසක් පුන් පොහෝ දිනටය. සකල ලෝක සත්ත්වයන් වෙත පතල මහා කරුණාවෙන් ලොවුතුරා බුදුබවට පත්වී වසර 2600 ක් සපිරෙන අවදියේදී අසදෘශ සම්බුද්ධ පූජා පිණිස ධර්මානුධර්ම ප්‍රතිපදාවට මුල්තැන දී ශාසනාභිවෘද්ධිය පතා ආගමික කටයුතු සම්පාදනය කළයුතුම වෙයි.

මහා බෝධිසත්ත්ව ගුණෝපේත අතිගරු පූජ්‍යනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේගේ සමුත්පාදකත්වයෙන් සහ අතිගරු පූජ්‍යනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඥාණාරාමාභිධාන මහෝපාධ්‍යායන් වහන්සේගේ නේතෘත්වයෙන් ආරම්භ කරන ලද ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව නම් වූ ප්‍රතිපත්ති සංවිධානයටද වසර සම සැටක් සපිරෙනුයේද 2011 වර්ෂයේ පොසොන් පුන් පොහෝදිනටය.

ඉහත සඳහන් වන සම්බුද්ධත්ව ජයන්තිය සහ සම සැට වසර සපිරෙන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රතිපත්ති සංවිධානයත් නිමිති කොට 2011 ජුනි මස 4-5 දෙදින තුලදී අනුරාධපුර ශුද්ධ භූමියෙහි ඓතිහාසික රුවන්මැලි මහසෑ මළුවේදී පැවැත්වෙන සාරාණීය මහා පුණ්‍යෝත්සවය පිළිබඳව දැනුවත් කිරීමේ මෙම පත්‍රිකාව පින්කම් සංවිධාන මණ්ඩලය විසින් සම්පාදනය කර ඇත. මෙම පත්‍රිකාව පින් කැමති සැම දෙනාගේ චිත්තප්‍රසාදය පිණිස අවබෝධය ගෙන දෙන ආලෝකයක් වනු නියතය.

තෙරුවන් සතු සූවිසි ගුණානුභාව බලයෙන් පින්කම් සංවිධාන මණ්ඩලයටත් පින්කම හා සම්බන්ධ වන සැමටත් නිදුක් නිරෝගී සුවපත් භාවයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් දීර්ඝායු ශ්‍රී සම්පත් අත්වේවා.!
ධර්මදාන භාවනා ඥාන අභිවර්ධනය වේවා.!
සම්‍යක් සංකල්පනා සියල්ල සමෘද්ධ වේවා.!
ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සුවසේම-සාක්ෂාත් වේවා.!

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"
මෙයට
මෙතැනි,



**ප්‍රධාන අනුශාසක මා හිමි,**
අග්ග මහා කම්මට්ඨානාචාර්ය
අතිගරු පූජ්‍යනීය **නාඋයනේ අරියධම්ම** මා හිමි



## පිංකම් පෙලහැර

- කුල දරුවන් සියදෙනෙක් පැවිදි කිරීම.
- මහා ස්ථූප අලෝක පූජාව.
- සත් බුද්ධ පූජාව.
- ලක්ෂ තුනකට අධික නෙළුම් මල් පූජාව.
- හයදහසකට අධික අටපිරිකර පූජාව.
- කප්රුක් පූජාව.
- තෙල් පහන් අලෝක පූජාව.
- මහා සුවඳ සුවඳ දුම් පූජාව.
- සුවඳ පැනින් සෑ මළුව සේදීම.
- හේවිසි පූජාව.
- සර්ව රාත්‍රික පිරිත් දේශණාව.
- දහසකට අධික මහා සංඝ රත්නය විෂයෙහි මහා සාංඝික දනමය පිංකම්.

## පිංකම් පෙලගැස්ම

**2011 ජූනි 04 ප.ව. 4.30 සිට**
මහා සංඝ රත්නය සෑ මළුවට වැඩම කිරීම.

**2011 ජූනි 04 ප.ව. 5.30 සිට**
බුද්ධ පූජා වැඩමවීම.

**2011 ජූනි 04 ප.ව. 6.00 සිට**
මහා ස්ථූප අලෝක පූජාව හා සත් බුදු වන්දනාව.

**2011 ජූනි 04 ප.ව. 9.00 සිට**
දහසකට අධික මහා සංඝ රත්නය විසින් පවත්වනු ලබන සර්ව රාත්‍රික පිරිත් දේශණාව.

**2011 ජූනි 05 පෙ.ව. 4.00 සිට**
කුල දරුවන් සියදෙනෙකු පැවිදි කිරීමේ පිංකම.

**2011 ජූනි 05 පෙ.ව. 5.30 සිට**
ක්ෂීරපායාස බුද්ධපූජාව හා මහා සාංඝික දානය

**මූලික අනුශාසනාව සහ සත්බුදු පූජාව පවත්වනු ලබන්නේ**
යෝගාශ්‍රමාධිපති, මහා කම්මට්ඨානාචාර්ය, අතිපූජනීය
**නාඋයනේ අරියධම්මාභිධාන මා හිමිපාණන් වහන්සේ විසිනි.**

# පිංකම හා පෙලගැසෙමු

ස්වර්ණමාලි මහා ථූපාභිවන්දනා පිංකම් මාලාව සංවිධානය කරනු ලබන්නේ
ගල්දූව ආරණ්‍ය සේනාසන මූලස්ථානය ප්‍රධානව දිවයින පුරා ව්‍යාප්තව පවතින
ශ්‍රී කල්‍යාණී යෝග්‍රාශ්‍රම සංස්ථානුබද්ධ සියලුම ආරණ්‍ය ශාඛාවල සහභාගිත්වයෙනි.

මෙම පින්කම හා සම්බන්ධ වීමට උනන්දුවක් දක්වන ඔබට ඕනෑම අයුරකින්
දායක වීමට සියලු අවකාශයන් විවෘතව ඇත. සියලුම විමසීම් පහත සඳහන් ලිපිනයෙන්
හා දුරකථන අංක වලින් මෙන්ම දිවයින පුරා ව්‍යාප්තව පවතින
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථානුබද්ධ සියලුම ආරණ්‍ය සේනාසන වලින් ලබා ගත හැක.

## ප්‍රධාන - පුණ්‍යෝත්සව සම්බන්ධීකරණ මණ්ඩලය

**ප්‍රධාන අනුශාසක මා හිමි,**
අග්ග මහා කම්මට්ඨානාචාර්ය
අතිගරු පූජණීය නාඋයනේ අරියධම්ම මා හිමි

**ප්‍රධාන සංවිධායක හිමි,**
ත්‍රිපිටක විශාරද,
ගරු පූජණීය කහගොල්ලේ සෝමවංශ හිමි
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා මූලස්ථානය,
ගල්දූව ආරණ්‍ය සේනාසනය,
ගල්දූව, කහව, අම්බලන්ගොඩ.
091 2256013, 071 8361466

**ප්‍රධාන සම්බන්ධීකරණ ලේකම් හිමි,**
ත්‍රිපිටකාචාර්ය,
ගරු පූජණීය මිරිහානේ නන්ද හිමි
ගරු පූජණීය ලග්ගල කල්‍යාණවංස හිමි
ගරු පූජණීය ගංගොඩවිල අරියගවේසි හිමි
ශ්‍රී කල්‍යාණී ධර්මාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
011 2696494, 077 3857453
**www.buddhistmonastery.asia**
**info@buddhistmonastery.asia**
**forestspringhill@yahoo.com**

**ගිහි අනුශාසක**
ගරු ආණ්ඩුකාරවර උතුරු පලාත
ජී. ඒ. චන්ද්‍රසිරි මහත්මා
ආචාර්ය සුදත් දේවපුර මයා

**ගරු සභාපති**
වෙළඳ ව්‍යාපාරික බන්දුසේන බේරුවලගේ මයා

**ගරු ලේකම්**
වෙළඳ ව්‍යාපාරික පියන් කුමාර මයා

**ගරු භාණ්ඩාගාරික**
වෙළඳ ව්‍යාපාරික කේ. පී. ජී. කුමාර මයා

**රුවන්වැලි මහා සෑ පින්කම් සමිතිය, සම්පත් බැංකුව අම්බලන්ගොඩ ශාඛාව, ගිණුම් අංකය :- 007260000068**

**මෙම පුණ්‍යෝත්සවය සඳහා පුද්ගලිකව හෝ වෙනත් සංවිධාන මගින් කිසිදු ආකාරයක ආධාර රැස්කිරීමක් සිදු නොවන බව කාරුණිකව දන්වා සිටිමු.**

සයිංසු යස්මිං සුගතස්ස ධාතු - නිම්මාය රන්සුප්ජල බුද්ධ රූපං

සුවණ්ණ මාලිතී පතීත නාමං - වන්දාමහං ථූපවරං මහග්ඝං

සාධූ ! සාධූ ! සාධූ !

2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය හා සබැඳිව

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම සැට වස් පූර්ණය සැමරුම